# රාජකාරී විදේශ සංචාරය පිළිබඳ වාර්තාව

**විදේශ සංචාරය: Modern Education Leadership and Management Training Programme for Sri Lanka Educational Administrative Service- 2017 Open Batch Officials**

**සංචාරයේ යෙදුන රට:** Malayasia

**කාලසීමාව:** 2018.10.17-2018.10.23


කේ.ඩබ්.එස්.එම්. සේනාරත්න

නියෝජ්‍ය විදුහල්පති (ශ්‍රී.ලං.අ.ප.සේ. iii)

ර/ ගන්කන්ද මධ්‍ය විද්‍යාලය

පැල්මඩුල්ල

# හැඳින්වීම

ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ සංකල්පයකට අනුව 2017 කණ්ඩායම බඳවාගන්නා ලද ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ ශ්‍රේණියේ නිලධාරීන්ට එක් වසරක පුහුණුවක් ලබා දී ඇති අතර එහි තවත් එක් දිගුවක් ලෙස නවීන අධ්‍යාපනික ක්‍රම සහ ක්‍රමවේදයන් උකහාගැනීම සඳහා විදේශීය පුහුණුවක් ලබා දෙන ලදී. විදුහල්පති සහ නියෝජ්‍ය විදුහල්පති තනතුරු නිලධාරීන්ගෙන් මෙම පුහුණු වැඩසටහන සඳහා දෙවන කණ්ඩායම තෝරාගෙන ඇත. පුහුණු වැඩසටහනට මැලේසියාවේ දින 6 ක් සහ සිංගප්පූරුවේ දිනයක්ද ඇතුළත් විය.

මැලේසියාවේ හා සිංගප්පූරුවේ අධ්‍යාපනය සඳහා භාවිතා කරන උසස් තාක්ෂණික ක්‍රමවේදයන් හා දේශීය අධ්‍යාපන ක්‍රමවේදය භාවිතා කිරීම පිළිබඳව ඉගෙනීම මෙම විදේශීය පුහුණු වැඩසටහනෙහි අරමුණ විය.

## පුහුණු වැඩසටහනේ අරමුණු

මැලේසියාව හා සිංගප්පූරුවේ භාවිතා කරන උසස් තාක්ෂණයන් අධ්‍යයනය කිරීම, උකහාගැනීම හා දේශීය අධ්‍යාපන පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා ඔවුන් භාවිතා කිරීම.

## පුහුණු වැඩසටහනේ අපේක්ෂිත ප්‍රතිඵල

21 වන සියවසේ පාසැල් උපදේශක නායකත්වය

## න්‍යාය පත්‍රය සහ වැඩසටහන් සැකැස්ම

පාසල් පදනමේ කළමනාකරණය පිළිබඳ නායකත්ව වැඩසටහන

(2018 ඔක්තෝබර්17 සිට 2018ඔක්තෝබර් 23 දක්වා)

| දිනය | වැඩසටහන |
|---|---|
| දිනය 01<br>(17 ඔක්තෝබර් 2018) | මැලේසියාවට පැමිණීම |
| දිනය 02 | UCTC හි ලියාපදිංචි කිරීම හා පිළිගැනීමේ උත්සවය |
| | **දේශන අංක 01**<br>මාතෘකාව - මැලේසියාවේ අධ්‍යාපන පද්ධතිය<br>( කථිකාචාර්ය ආචාර්ය රොස්ලි ඊබ්‍රාහිම්, අධ්‍යාපන අමාත්‍යංශය- මැලේසියාව) |
| | **දේශන අංක 02**<br>මාතෘකාව - නායකත්ව ගුණාංග සහ උපාය මාර්ග<br>(ඩැනියෙල් හස්නි මුස්තාෆා, පුත්‍රා විශ්ව විද්‍යාලය - මැලේසියාව) |
| | **දේශන අංක 03**<br>මාතෘකාව -මැලේසියාවේ අධ්‍යාපනික තාක්ෂණය<br>(අධ්‍යාපන තාක්ෂණ අංශය, අධ්‍යාපන අමාත්‍යංශය - මැලේසියාව |
| | **දේශන අංක 04**<br>මාතෘකාව - ජාතික අධ්‍යාපන ඇගයීම් ක්‍රමය<br>( ආචාර්ය රාහිමා ආදම්, විභාග සම්බන්ධීකාරක, අධ්‍යාපන අමාත්‍යංශය - මැලේසියාව) |
| දිනය 03 | **නිරීක්ෂණ චාරිකාව 01**- එස්.එම්.කේ. ජලාන් බංගි සෙලන්ගෝර් (උසස් දක්ෂතා පාසල) |
| | **නිරීක්ෂණ චාරිකාව 02**- කොලොජුවාසොසිං ෂෙපාන්, සෙලන්ගෝර් (වෘත්තීය පාසල) |
| දිනය 04 | **දේශන අංක 05**<br>මාතෘකාව - 21 වන සියවසේ පාසැල් විදුහල්පතිවරුන් සඳහා උපදේශක නායකත්වය<br>(ආචාර්ය බාලසන්ද්‍රන් , රාමියා ආමිඩින්ඩින් ආයතනය, අධ්‍යාපන අමාත්‍යංශය - මැලේසියාව) |
| දිනය05 | බැහැරගත පුහුණු වැඩසටහන (Out Bound Training ) |
| දිනය 06 | **නිරීක්ෂණ චාරිකාව 03**<br>Greenview Islamic International School - ග්‍රීන්විව් ඉස්ලාම් ජාත්‍යන්තර පාසලෙහි ක්ෂේත්‍රචාරිකාව |
| | **නිරීක්ෂණ චාරිකාව 04**<br>SJKT Bandar Sri Sendayan පාසලෙහි ක්ෂේත්‍රචාරිකාව |
| | **දේශන අංක 06**<br>මාතෘකාව - ඵලදායී ඉගැන්වීම් පුහුණුව<br>(මුතුසාමි මනෝහරන් මහතා, අධ්‍යාපන අමාත්‍යංශය - මැලේසියාව) |
| දිනය 7<br>(23 ඔක්තෝබර් 2018) | සිංගප්පූරුව බලා පිටත්වීම |
| | **නිරීක්ෂණ චාරිකාව**<br>සිංගප්පූරු ගුවන් තොටුපොළෙන් ශ්‍රී ලංකාව බලා පිටත් වීම |

-

# මැලේසියානු අධ්‍යාපන ක්‍රමය

මැලේසියානු අධ්‍යාපනය, ආරම්භක අවධියවන පෙර පාසල සිට විශ්ව විද්‍යාල මට්ටම දක්වා විහිදේ. අධ්‍යාපනයෙහි වගකීම මැලේසියානු රජය සතුය.පෙර පාසල සිට ද්විතියික අධ්‍යාපනය මැලේසියානු අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ද තෘතියික අධ්‍යාපනය උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ද ක්‍රියාත්මකවේ.

**<u>ප්‍රාථමික අධ්‍යාපනය</u>**

- ඇතුළත් වීමේ වයස අවුː 7 වේ.
- වයස අවුː 7-12 දක්වා සිසුන්ට අනිවාර්ය වේ.
- වසර 6 ක් ක්‍රියාත්මක වේ.
- ප්‍රාථමික අධ්‍යාපනය අවසන් වී ද්විතියික අධ්‍යාපනය ආරම්භ කිරීමට පෙර පරීක්ෂණයක් (UPSR)පැවැත්වේ.

| ප්‍රාථමික ශ්‍රේණිය | වයස අවුː |
|---|---|
| 1 ශ්‍රේණිය | 7 |
| 2 ශ්‍රේණිය | 8 |
| 3 ශ්‍රේණිය | 9 |
| 4 ශ්‍රේණිය | 10 |
| 5 ශ්‍රේණිය | 11 |
| 6 ශ්‍රේණිය | 12 |

**<u>ද්විතියික අධ්‍යාපනය</u>**

පහළද්විතියික හා ඉහළ ද්විතියික මට්ටම් 2 කි.

- පහළ ද්විතියික අධ්‍යාපනය ː වසර 2
- ඉහළ ද්විතියික අධ්‍යාපනය ː වසර 3
- එක් සිසුවෙක් විෂය සමගාමී ක්‍රියාකාරකම් 2ක වත් යෙදීම අනිවාර්ය වේ.

| පංති තරම | ඇගයීම |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | ඇගයීම |
| 4 | |
| 5 | SPM |
| 6 | පූර්ව විශ්වවිද්‍යාල |

පංති තරම 3 හි සිදු කරන ඇගයීම මගින් සිසුන් අංශ 3 කට වෙන් කරනු ලබයි.

- අධ්‍යයන විෂය ධාරාව විද්‍යා/කලා
- තාක්ෂණ හා වෘත්තීය විෂය ධාරාව
- ආගමික විෂය ධාරාව

ද්විතියික අධ්‍යාපනය සම්පූර්ණ කරන ලද සිසුන්ට පශ්චාත් ද්විතියික අධ්‍යාපනය ලැබීමට අවස්ථාව ඇත(වසර 1-2 කාලයක්). එය උසස් අධ්‍යාපනය සඳහා සූදානම්වීමේ පාඨමාලාවකි. උපාධිය වසර 3 කි.

# සේපන්ග් වෘත්තීය විද්‍යාලයේ ක්ෂේත්‍ර චාරිකාව

මැලේසියානු අධ්‍යාපන ක්‍රමය පිළිබඳ අවබෝධයක් ලබා දීම සඳහා වැඩසටහන තුළ දී ක්ෂේත්‍ර චාරිකා කිහිපයක යෙදෙන්නට අවස්ථාව සැලසිණි. මෙහිදී 2018.10.19 දින උදෑසන පළමු ක්ෂේත්‍ර චාරිකාව ලෙස (Sepang Vocational College) සේපන්ග් වෘත්තීය විද්‍යාලයෙහි අධ්‍යයනයක යෙදුනි.

Knowledge Values Skillයන ආදර්ශ පාඨය යටතේ ක්‍රියාත්මක වන වෘත්තීය පුහුණුව ලබා දෙමින් සිසුන් අනාගත වැඩලෝකය සඳහා සූදානම් කරවීම මෙහි මූලික අරමුණයි. මැලේසියානු අධ්‍යාපන ක්‍රමය අනුව 1 සිට 6 ශ්‍රේණිය දක්වා (වයස අවුරුදු 11 වන තුරු) ප්‍රාථමික අධ්‍යාපනය ලබන සිසුන් ද්විතියික අධ්‍යාපනය සඳහා ද්විතියික පාසලකට ඇතුළත් වේ. එහි දී වයස අවුරුදු 16 ක් දක්වා ද්විතියික පාසල තුළ අධ්‍යාපනය ලැබීමට හැකි වන අතර සිසුන්ගේ කැමැත්ත මත ද්විතියික අධ්‍යාපනයෙන් පසු වෘත්තීය අධ්‍යාපනයට පිවිසිය හැක. වෘත්තිය අධ්‍යාපනය අ.පො.ස සා.පෙළ මට්ටමට සමාන වන අතර අවුරුදු දෙකක කාලයක් වෘත්තිය විද්‍යාලය තුළ අධ්‍යාපනය ලබමින් වෘත්තිය පුහුණුවක් ලබා ගැනීමට සිසුන්ට අවකාශ සැලසේ.

අප විසින් නිරීක්ෂණය කරන ලද සෙපන්ග් වෘත්තීය විද්‍යාලය මගින් සිසුන්ට පාඨමාලා රාශියක් හැදෑරීමට අවකාශ ලබා දේ. මෙම වෘත්තීය විද්‍යාලය මගින් ලබා දෙන පාඨමාලාවන් පහත පරිදි වේ.

1. Automative technology - **රථවාහන තාක්ෂණවේදය**
2. Air conditioning and refrigeration technology - **වායු සමීකරණ හා ශීතකරණ තාක්ෂණවේදය**
3. Fashion design - **විලාසිතා නිර්මාණකරණය**
4. Culinary arts - **ආහාර පිසීමේ තාක්ෂණවේදය**
5. Accounting - **ගිණුම්කරණය**
6. Computer system and networking technology - **පරිගණක පද්ධති ජාලගතකරණ තාක්ෂණවේදය**
7. Database management system and web application technology - **දත්ත කළමනාකරණ පද්ධති සහ වෙබ් තාක්ෂණවේදය**

සේපන්ග් වෘත්තීය විද්‍යාලය මගින් හඳුන්වා දෙන පාඨමාලාවන් මගින් රැකියා වෙළඳපොළ සඳහා සිසුන් සූදානම් කිරීම හා අනාගතයේ සාර්ථක ව්‍යවසායකයෙකු බිහිකිරීම මෙන් ම සිසුන්ගේ ඉදිරි අධ්‍යාපන කටයුතු සඳහා උරදීම අපේක්ෂා කෙරේ.

වෘත්තීය විද්‍යාලය තුළ අධ්‍යාපනය ලබන සිසුන් හට විද්‍යාලය මගින් විද්‍යාගාර පහසුකම්, පරිගණක විද්‍යාගාර පහසුකම්, ආහාර විද්‍යාව හැදෑරීම සඳහා පහසුකම් සපිරි මුළුතැන්ගෙවල් හා අති නවීන දේශනශාලා පහසුකම් සපයා ඇත. තව ද සිසුන් සඳහා නේවාසික පහසුකම් ද සපයා දී ඇත. විද්‍යාලය තුළ ඉගෙනුම ලබන සිසුන්ගේ දැනුම පුළුල් කිරීම සහ වැඩමුළු සංවිධානය කරවීමට ද විද්‍යාලයීය අධ්‍යයන කාර්ය මණ්ඩලය උත්සුක වී ඇත.

මෙම විද්‍යාලයේ තවත් විශේෂත්වයක් වනුයේ විද්‍යාලයේ පුස්තකාලය නව ප්‍රවීණතා හඳුන්වා දෙමින් සිසුන් විසින් ම නඩත්තු කර පවත්වාගෙන යාමයි. මෙහි දී ශ්‍රී ලංකාවේ පාසලක සාමාන්‍ය පුස්තකාලයක මෙන් නොව දැනුම ගවේෂණයට ද අවස්ථාව සලසා දී ඇති බව පෙනේ. පුස්තකාලයට අනුබද්ධිතව පරිගණක විද්‍යාගාරයක් ද පිහිටුවා ඇත. එසේම දැනුම සමඟ විනෝදය සැපයීමේ අරමුණින් ගෘහස්ත ක්‍රීඩා ලෙස කැරම්, චෙස් ආදියෙහි යෙදීමේ අවස්ථාව සලසා දී ඇත.

විවිධ පාඨමාලාවන්ට අදාල සෛද්ධාන්තික දැනුම ලබාදීමෙන් පසුව එය ප්‍රායෝගික පුහුණුව සඳහා ද අවකාශ සලසා දී ඇති අතර ප්‍රායෝගික පුහුණුවෙන් පසුව දැනුම මැන බැලීම සඳහා ප්‍රායෝගික පරීක්ෂණ ද පවත්වනු ලැබේ.





# Jalan Empat Secondary School

## ජලාන් එම්පත් ද්විතීයික පාසලෙහි ක්ෂේත්‍ර චාරිකාව

'' **දක්ෂතම ශිෂ්‍යයන් බිහි කරන සුපිරි පාසලක්** '' යන දැක්ම ඔස්සේ ක්‍රියාත්මක වන මෙම ද්විතියික පාසල ප්‍රදේශයේ ඉහළ දක්ෂතා දක්වන පාසලකි. මෙම පාසලටම අනන්‍ය වූ සේවාවක් ඔස්සේ ක්‍රියාත්මක වන ඉහළ සංස්කෘතික අගයයන්ගෙන් හා විශිෂ්ඨතාවයන් ප්‍රදර්ශනය කරමින් අන්තර්ජාතික තලය හා තරඟ කරන්නා වූ පාසලකි.

දීර්ඝ ඉතිහාසයකට උරුමකම් නොකියන මෙම පාසල 2003 වර්ෂයේදී ආරම්භ කර ඇත. මෙම පාසලට ඇතුළත් වීම සඳහා දැඩි තරඟකාරීත්වයක් පවතින අතර ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ යාම නිසා වරු දෙකකින් පාසල පැවැත්වීමට සිදු වී ඇත. උදෑසන 7.30 සිට 1.40 වන තුරු පළමු වරුව ද, (එනම් 3,4,5 වසරවල සිසුන් සඳහා) සවස් වරුව 12.15-6.45 අතර කාලය තුල (1 හා 2 වසර සිසුන් සඳහා) පවත්වනු ලබයි.

ආරම්භයේදී සිසුන් 143 ක් සමඟ ගුරුවරුන් 25 කින් ආරම්භ කරන ලද මෙම පාසල වර්තමානයේ සිසුන් 1500 කින් හා ගුරුවරුන් 75 ක් පමණ සමන්විත වේ. මැලේසියාවේ අධ්‍යාපන ක්‍රමයෙහි පවත්වන විභාගයන් වන SPM මට්ටමේ විභාගවලදී මෙම විද්‍යාලයෙහි සමත් ප්‍රතිශතය 100% කි. 2007 වසරේදී මැලේසියාවේ විශිෂ්ඨතම පාසල් 5 අතරට පත්ව ඇති මෙම පාසල විෂය සමගාමී ජයග්‍රහණ රාශියක් ද අත්පත් කරගෙන ඇත. එසේ ම ජාත්‍යන්තර සමුළු ආදියට සහභාගීත්වය සඳහා ද සුදුසුකම් ලබා ඇති මෙම පාසලේ සිසුන් කදවුරු ගත ක්‍රියාකාරකම් හා අභියෝගාත්මක ක්‍රියාකාරකම් වලදී ද දක්ෂතා ප්‍රදර්ශනය කර ඇත.





## Jalan Empat ද්විතියික පාසල තුළ හඳුනාගන්නා ලද විශේෂත්වයන්

පාසල විදුහල්පති හා ගුරු මණ්ඩලය යටතේ පාලනය වන්නක් වුවද, පාසලේ විනය පවත්වා ගැනීමේ ලා පාසලේ ශිෂ්‍ය නායකයන් හා නායිකාවන් වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ලබයි. මෙය ශ්‍රී ලංකාවේ පාසල්වල තත්ත්වයට සමාන තත්වයකි. එසේම පාසලෙහි උදය සහ සවස් වරුවල ඉගැන්වීම් කටයුතු ක්‍රියාත්මක කරන අතර අමතර ඉගැන්වීම් අවශ්‍ය සිසුන්ට සවස්වරුවේ පංති සඳහා ද සහභාගී විය හැක. පාසල් විෂය මාලාව තුළ විෂය සමගාමී කටයුතු සඳහා ද අවස්ථාව සලසා දී ඇති අතර එම විෂය සමගාමී කටයුතු සඳහා ගුරු මණ්ඩලයේ සහාය ලබාදීම අනිවාර්ය කර තිබේ. ගෘහස්ත ක්‍රීඩා සඳහා විශේෂ ස්ථානයක් හිමිවන අතර අනෙකුත් ක්‍රීඩා පාසල තුළ එතරම් ක්‍රියාත්මක නොවන බව පෙනේ. තව ද සංගීතය, නර්තනය වැනි සෞන්දර්යාත්මක විෂයයන් සඳහා ද අවධානය යොමු කර නැති බව දක්නට ලැබිනි.

# Greenview Islamic International School

## ග්‍රීන්වීව්ඉස්ලාම් ජාත්‍යන්තර පාසලෙහි ක්ෂේත්‍රචාරිකාව

සිසුන්ට ලබා දිය හැකි අධ්‍යාපනය ඉහළ මට්ටමින් ලබා දීම අරමුණු කරගත් Greenview Islamic ජාත්‍යන්තර පාසල විභාග කේන්ද්‍රගත කරගත් අනෙකුත් ආසියානු පාසල් මෙන් නොව සිසුන්ගේ දක්ෂතා හා අවසාන විභාග ලකුණු යන සියළු අංශ සැලකිල්ලට ගනිමින් සිසුන්ව ඇගයීමට ලක් කිරීම සිදු කරනු ලබයි. හොඳ පාසල් අධ්‍යාපනයක් මගින් සිසුන්ගේ කුසලතා වර්ධනය කරමින් ලොව අනාගත අභියෝග ජයගන්නා සාර්ථක පුරවැසියන් බිහි කරන බව Greenview Islamic ජාත්‍යන්තර පාසලෙහි අරමුණ වේ.

මෙම පාසලෙහි සිසුන්ගේ අධ්‍යාපනයෙහි අංශ 3 ක් කෙරෙහි අවධානය යොමු කෙරේ.

1. අධ්‍යාපන ජයග්‍රහණ
2. චරිත සංවර්ධනය
3. ආධ්‍යාත්මික ශක්තිමත් කිරීම

2016-2017 අතර කාල වකවානුවේ පාසලෙහි ප්‍රතිඵල

| | |
|---|---|
| අවසාන විභාගයෙන් A හෝ B සමාර්ථ ලබා ගත් ප්‍රතිශතය (කනිෂ්ඨ අංශය) | 96% |
| අවසාන විභාගයෙන් A හෝ B සමාර්ථ ලබා ගත් ප්‍රතිශතය (ජ්‍යෙෂ්ඨ අංශය) | 77% |

# SJKT Bandar Sri Sendayan

## පාසලෙහි ක්ෂේත්‍රචාරිකාව

මෙම පාසල 1951 ආරම්භ කරන ලද පාසලක් වුවද සිසුන් සංඛ්‍යාව ඉහළයාම නිසා නැවත වෙනත් ස්ථානයක ස්ථාපිත කිරීමට සිදුවිය. බොහෝ ඉන්දීය ජාතික පවුල්වල දරුවන් දෙමළ භාෂාවෙන් ඉගෙනුම ලැබීමට මෙම පාසලට ඇතුළත්වේ. පෙර ද මෙම පාසල සතුව අවම පහසුකම් ප්‍රමාණයක් පැවති අතර පසුව ප්‍රජාව විසින් පාසල නවීකරණය කර රජයට භාරදෙන ලදි.

අතිනවීන පහසුකම්වලින් සමන්විත මෙම පාසල පුස්තකාල පහසුකම්, ශ්‍රවනාගාර පහසුකම් ,උපදේශන කාමර ,විද්‍යාගාර පහසුකම්, පරිගණක පහසුකම්, ආපනශාලා පහසුකම් සිසු දරුවන්ට ලබා ගත හැක.







# නිරීක්ෂණ

- ගුරුවරුන් සහ අනෙකුත් පාසල් ප්‍රජාව මුහුණ දෙන ගැටළු ජයගැනීමට ගුරුවරුන්ට සහ ගුරුවරුන්ට උපකාර කිරීම නිසා අධ්‍යාපන නායකයෙකුට ඉතා වැදගත් කාර්යභාරයක් ඉටුකරනු ලබයි.
- විභාගය ක්‍රියාවලියේදී සිසුන්ගේ උසස් ආධ්‍යාත්මික චින්තන කුසලතා පරීක්ෂා කිරීම සහ ඉගැන්වීමේ ක්‍රියාවලියෙන් උසස් ශ්‍රේණියේ චින්තන හැකියාවන් වර්ධනය කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම.
- ශිෂ්‍යයා සහ ගුරුවරයා යන දෙඅංශයටම පහසුකම් සැපයීම සඳහා අධීක්ෂණය කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම ලෙස සිදු කෙරේ.
- ඉගැන්වීම් ක්‍රියාවලියේදී තාක්ෂණය බොහෝ සෙයින් භාවිතා වේ. අන්තර් ක්‍රියාකාරී සුහුරු පන්ති කාමර ඉගෙනගන්නන් සඳහා ඉතා ඵලදායී වේදිකාවක් නිර්මාණය කරයි. ඔවුන" ඔබේම උපකරණයක් " යන සංකල්පය දිරිමත් කරනු ලැබේ.
- මැලේසියාවේ අධ්‍යාපනය සඳහා වෙන් කර ඇති මුදල දළ දේශීය නිෂ්පාදිතයෙන් 1/3 කි. ගුරුවරුන්ට ලබාදෙන වැටුප් සාපේක්ෂව ඉහළ ය. අධ්‍යාපනයේ ඉදිරි ප්‍රවණතා සමඟ ගුරුවරුන් ද නිතරම යාවත්කාලීන කළ යුතුය.
- අධීක්ෂණ ක්‍රියාවලියෙහි පසු විපරම් සිදුකරනු ලැබේ.
- විෂයමාලා සැලසුම් කිරීමේදී, සිසුන්ගේ චින්තන කුසලතා වැඩිදියුණු කිරීම කෙරෙහි වැඩි අවධානය යොමු කර ඇත.
- ශිෂ්‍යයින්ගේ උසස් නිපුණතා කුසලතා ඇගයීම සඳහා ඇගයුම් ක්‍රියාවලිය සිදු කරනු ලැබේ.
- ඔවුන්ගේ පාසැල් සංවර්ධන සැලැස්ම පිළිබඳව ඔවුන් දැඩි සැලකිල්ලක් දක්වයි.
- ඔවුන් 4C හි වැඩි අවධානයක් යොමු කරයි (නිර්මාණශීලීත්වය, සහයෝගීතාවය, සන්නිවේදනය, විවේචනාත්මක චින්තනය- Creativity,Cooperation,Communication,Crit ical Thinking)
- පුස්තකාල කියවීම පමණක් නොව චෙස්, වැනි ක්‍රීඩා චින්තන කුසලතා වර්ධනය කිරීමට උපකාරී වේ.
- පුස්තකාලය හා විද්‍යාගාර පරිශ්‍රය ඉතා ප්‍රසන්න හා ඉතා ශක්ති සම්පන්න ඉගෙනුම් පරිසරයක් සපයයි.
- විවිධ පර්යේෂණ වලට අදාළ පින්තූර සහිත බිත්ති පවා පාසල් පරිශ්‍රයේ විද්‍යාගාර ආශ්‍රිතව නිර්මාණය කර ඇත.
- ඉහළ කාර්යසාධනය සහිත පාසල උදෑසන හා සවස ලෙස සැසි දෙකක දී ක්‍රියාත්මක වන අතර අවකාශය උපරිම ලෙස භාවිතා කිරීම හා සිසුන්ගේ සංඛ්‍යාව අවම කිරීම මෙහි අරමුණ වී ඇත.

# සාකච්ඡාව

මැලේසියානු ක්ෂේත්‍ර චාරිකාවේ යෙදීම මගින් එම අධ්‍යාපන පද්ධතිය, මැලේසියාවේ රජයේ පාසල්, ජාත්‍යන්තර හා පෞද්ගලික පාසල් පිළිබඳව හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හැකි විය.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සමඟ සන්සන්දනාත්මකව බැලීමේ දී මැලේසියානු අධ්‍යාපන ක්‍රමය හා ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය අතර වෙනස්කම් ද සමානකම් ද දක්නට ලැබුනි.

ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය බොහෝ අවස්ථාවලදී පොත පතෙහි දැනුමට සීමා වී ඇති බවත්, විෂය බාහිර හා විෂය සමගාමී කටයුතු කෙරේ ඇති අවධානය අඩු බවත් දක්නට ලැබේ. දැනට විෂය සමගාමී කටයුතු/ක්‍රීඩා ආදිය සඳහා ලකුණු පිරිනැමීම් ක්‍රමවේදය යටතේ සිසුන් විෂය සමගාමී කටයුතු 2 ක් වත් සිදු කල යුතු වේ. මැලේසියාවේ අධ්‍යාපන ක්‍රමය තුළ සිසුන්ට ශ්‍රේණි හා ලකුණු පිරිනැමීමේ දී විෂය සමගාමී කටයුතුවල සහභාගීත්වය ද සැලකිල්ලට ගනු ලැබේ.

එසේම ශ්‍රී ලංකාවේ 1 ශ්‍රේණියේ සිට 13 ශ්‍රේණිය දක්වා පාසල් අධ්‍යාපනයත්, පාසල් අධ්‍යාපනයෙන් පසු උසස් අධ්‍යාපනයත් සිදුකිරීම බොහෝ විට සිදුවන අතර වෘත්තීය අධ්‍යාපනය ලැබීමට සිසුන්ට ඇති අවකාශ අඩුය. නමුත් මැලේසියාවේ අධ්‍යාපන ක්‍රමය යටතේ වෘත්තීය අධ්‍යාපනය ලැබීමට වෘත්තීය විද්‍යාල පිහිටුවා ඇති අතර සිසුන්ගේ අභිමතය පරිදි උසස් අධ්‍යාපනය ලැබීම හෝ වෘත්තීය අධ්‍යාපනය ලැබීම තෝරා ගත හැක.

මෙම ප්‍රවණතාව ශ්‍රී ලංකාව තුළ ද ක්‍රියාත්මක කිරීමේ එක් පියවරක් ලෙස 13 වසරක සහතික කරන ලද අධ්‍යාපනය හඳුන්වා දීම දැකිය හැකිය. මෙහිදී සිසුන්ගේ අභිමතය පරිදි විෂය තෝරා ගැනීම සිදුකළ හැකි අතර එහිදී වෘත්තීය පුහුණුවක් පාසල තුළින් ම ලබාගැනීම මගින් රැකියා වෙළඳපොලට පිවිසීමට හැකියාව ලැබේ.

මැලේසියානු අධ්‍යාපන ක්‍රමවේදයෙහි ඇති තවත් විශේෂත්වයක් වනුයේ ගුරුවරුන් සඳහා ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදයක් පැවතීමයි. එහි ගුරුවරුන් අගය කිරීම සඳහා ''විශිෂ්ඨතම ගුරුභවතා''(Excellent teacher method) වන සංකල්පය ක්‍රියාත්මක කරනු ලබයි.

මෙහිදී මෙම තෝරා ගැනීම සඳහා පිටතින් නිරීක්ෂණ කණ්ඩායමක් පැමිණෙන අතර ගුරුවරයාගේ ඉගැන්වීම් ක්‍රියාවලිය අධීක්ෂණය කරනු ලබයි. මෙහිදී විශිෂ්ඨ ගුරුභවතා ලෙස උසස් වීම් ලබා දෙන අතර විශිෂ්ඨ ගුරුභවතා සම්මානය ලබා දීම ද, වැටුප ඉහල නැංවීමද සිදු කරයි.

නිරීක්ෂණය සිදු කරන ආකාරය තුන් ආකාරයකින් සිදුවේ.

1. ගුරුවරයා අධීක්ෂණය කිරීම.
2. විදුහල්පති හරහා විමසීම.
3. ලේඛන පරීක්ෂා කිරීම.

**මැලේසියාවේ ගුරුවරුන් ශ්‍රේණිගත කිරීම.**

**විශේෂ ශ්‍රේණිය**

| ශ්‍රේණිය | වසර |
|---|---|
| 54 | වසර 3 |
| 52 | වසර 4 |
| 48 | වසර 8 |
| 44 | වසර 10 |
| 41 | |